# වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව මහජනතාවට ඉටුකරන සේවා පිළිබඳ දැනුවත් කිරීමයි..........

## ❖ කසළ කළමනාකරණය

- වීදුරු බෝතල්, ප්ලාස්ටික්, හිස්ටින්, තහඩු, යකඩ, පොලිතින් වැනි නොදිරණ ද්‍රව්‍ය හා දිරණ කසළ වෙන් කර කසළ එකතු කරන ට්‍රැක්ටර් රථය වෙත භාර දීමට කටයුතු කරන්න.
- පැම්පස් වැනි සායනික ද්‍රව්‍ය පිටතට නොයෙන ලෙස ආරක්ෂිත උරයක දමා ට්‍රැක්ටර් රථය වෙත භාර දීමට කටයුතු කරන්න.
- කැපූ ගස් අතු බැහැර කිරීමේ දී ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලය හෝ උප කාර්යාල වෙත පහත ගාස්තුවක් ගෙවා සේවාව ලබා ගත හැක.

| | | |
|---|---|---|
| **ගාස්තුව** | - | ට්‍රැක්ටර් ලෝඩ් එකක් රු.3000.00 |
| | - | ට්‍රැක්ටර් ලෝඩ් භාගයක් රු.1500.00 |

- පහත ස්ථාන වලට වෙන් කරන ලද කසළ භාර දිය හැක.

| | | |
|---|---|---|
| පෙ.ව 7.00 - ප.ව 8.00 දක්වා | - | දුම්මලදෙණිය පාලම අසල කසළ භාර ගැනීමේ ස්ථානය |
| - එම - | - | දන්කොටුව සතිපොල භූමියේ කසළ භාර ගැනීමේ ස්ථානය |
| පෙ.ව 8.00 - ප.ව 5.00 දක්වා | - | කිරිමැටියාන උපකාර්යාලය අසල කසළ භාර ගැනීමේ ස්ථානය |
| - එම - | - | සෙන්දිරියාමුල්ල කසළ භාර ගැනීමේ ස්ථානය |
| - එම - | - | කහටවිල මහයායවත්ත කසල භාර ගැනීමේ ස්ථානය (නොදිරන) |

- වරිපනම් සීමාවෙන් පිටත කසළ එකතු කිරීම සඳහා මාසයකට එක් නිවසකින් රු.200.00 ක මුදලක් අය කෙරේ.
- කසළ පුළුස්සන අයට සහ මාර්ගය දෙපස හා පොදු ස්ථානවලට කසළ බැහැර කරන අයට විරුද්ධව නීතිමය පියවර ගනු ලැබේ.
- වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව මගින් නිෂ්පාදනය කරන උසස් ප්‍රමිතියෙන් යුක්ත කාබනික පොහොර පහත සඳහන් ස්ථාන වලින් ලබාගත හැකිය.

**සෙන්දිරියාමුල්ල ඝණ අපද්‍රව්‍ය මධ්‍යස්ථානය / කිරිමැටියාන උපකාර්යාලය**
**වෙන්නප්පුව ප්‍රධාන කාර්යාලය / කම්මල්පත්තුව උපකාර්යාලය / දන්කොටුව උපකාර්යාලය**

## ❖ මහජන සෞඛ්‍ය

- නිවාස හා ව්‍යාපාරික ස්ථානවල පරිශ්‍රයන් මදුරුවන් හා සතුන් බෝ නොවන ලෙස පවිත්‍රව තබා ගත යුතුය.
- ආහාර නිෂ්පාදන හා බෙදා හරින ආයතන මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ (PHI) උපදෙස් මත පවත්වාගෙන යා යුතුය. වාර්ෂිකව බලපත්‍ර ලබාගෙන වෙළඳ සැලෙහි ප්‍රදර්ශනය කර තැබිය යුතුය.
- භාවිතයට නොගත් ඉඩම් එළිපෙහෙළි කර සංවර්ධන කාර්යයකට හෝ වගාවකට භාවිතා කළ යුතුය.

## ❖ විථී පහන්

- විථී පහන් සම්බන්ධ පැමිණිලි ප්‍රධාන කාර්යාලයට හෝ උපකාර්යාල වෙත වාර්තා කරන්න. කොට්ඨාස මට්ටමින් සති දෙකකට වරක් අළුත්වැඩියා කටයුතු සිදු කරනු ලැබේ.
- උදෑසන 6.00 වන විට විථී පහන් නිවා දමන්න. දිවා කාලය තුළ දැල්වෙන විථී පහන් ඉවත් කරනු ලැබේ. නැවත සවිකිරීම සඳහා ගාස්තුවක් අයකරනු ලැබේ.

## ❖ මාර්ග

- සභාව මගින් සභාව සතු මාර්ගයක් ලෙස ගැසට් කර ඇති මාර්ග පමණක් නඩත්තු කරනු ලැබේ.
- මාර්ග දෙපස නිවෙසියන් විසින් පිරිසිදු කර තබා ගත යුතු අතර, ගස් හා පැළ සිටුවීම නොකළ යුතුය.
- සියළුම මාර්ග හා මාර්ග දෙපස ප්‍රාදේශීය සභාවේ අවසරයකින් තොරව පළුදු කිරීම දඩුවම් ලැබිය හැකි වරදකි.
- නිවාස හා ව්‍යාපාරික ස්ථාන වල අප ජලය කාණු වලට බැහැර කිරීම දඩුවම් ලැබිය හැකි වරදකි.
- කාණු පද්ධතිය කොන්ක්‍රීට් දමා හෝ කිසිදු ආකාරයකින් අවහිර නොකළ යුතුය.
- මාර්ගයේ සිට නිවසට හෝ ව්‍යාපාරික ස්ථානයට ප්‍රවේශ වන (ඇතුළු වන) පොදු කොටසෙහි ස්ථිර ඉදිකිරීමක් කෙරේ නම් ඒ සඳහා ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ගත යුතුය.

## ❖ අනතුරුදායක ගස්

- යාබද දේපලකට හෝ ජීවිතයකට අනතුරුදායක ලෙස පවතින ගස්, ගස් අතු කපා ඉවත් කළ යුතුය. එසේ නොවන අවස්ථා වලදී ප්‍රාදේශීය සභාව විසින් ගාස්තු අයකර කපා දමනු ලැබේ.

## ❖ ඉඩම් හා ගොඩනැගිලි අනුමත කිරීම

- ඉඩමක් මිලදී ගැනීමේ දී ඉඩමේ මිනින්දෝරු සැලැස්ම ප්‍රාදේශීය සභාවෙන් අනුමත කර ඇත්දැයි පරීක්ෂා කර බලන්න.
- නිවසක්, ගොඩනැගිල්ලක්, තාප්පයක් හෝ ඕනෑම ඉදිකිරීමක් සිදු කිරීමට පෙර ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.
- ඉදිකර ඇති නිවසක්, ගොඩනැගිල්ලක් මිලදී ගැනීමේ දී හෝ බද්දට ගැනීමේ දී ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ඇති දැයි දැනුවත් වන්න.
- නිවසක් හෝ ගොඩනැගිල්ලක් භාවිතා කිරීමට පෙර අනුකූලතා සහතිකය ලබා ගත යුතුය.

## ❖ ලබා ගත යුතු බලපත්‍ර

- ඔබ විසින් පවත්වාගෙන යන ව්‍යාපාර සඳහා වෙළඳ බලපත්‍රය හා පරිසර ආරක්ෂණ බලපත්‍රය වාර්ෂිකව ලබා ගත යුතුය.
- වෙළඳ ප්‍රදර්ශණ, විනෝද සැණකෙළි සඳහා බලපත්‍රය ප්‍රසංගය පැවැත්වීමට පෙර ලබා ගත යුතුය. විනෝද බදු වශයෙන් මුද්‍රණය කරන ලද ටිකට් පත්වල මුළු වටිනාකමින් 10% ගෙවිය යුතුය.
- දැන්වීම්, බැනර් ප්‍රදර්ශනය සඳහා නියමිත ගාස්තු ගෙවා බලපත්‍රයක් ලබා ගත යුතුය.

## ❖ ගෙවිය යුතු බදු හා ගාස්තු

- සභාවේ සේවාවන් පවත්වාගෙන යාම සඳහා අයකරන බදු හා ගාස්තු ප්‍රධාන කාර්යාලයට හෝ උපකාර්යාල වෙත ගෙවා ඔබගේ සහාය ලබා දෙන්න. ඔබගේ නිවසට හෝ ව්‍යාපාරික ස්ථානයට පැමිණෙන නිලධාරින්ගේ රාජකාරි හැඳුනුම්පත පරීක්ෂා කර අනන්‍යතාවය තහවුරු කර ගන්න. අපගේ සේවාවන් සහ මාර්ගගත ගෙවීම් පහත සඳහන් වෙබ් අඩවි වලට පිවිස සිදු කළ හැකිය.

  **www.pswennappuwa.lk** හෝ **pay.cat2020.lk**

## ❖ ඔබ වෙනුවෙන් අපගේ සේවාවන්

- ජනාකීර්ණ ප්‍රදේශවල කසල ඉවත් කිරීම. (යොදවා ඇති ට්‍රැක්ටර් ගණන 11 කි. කම්පැක්ටර් 01 කි.)
- ආයුර්වේද ප්‍රතිකාර සේවාව/ දන්කොටුව පංචකර්ම ප්‍රතිකාර මධ්‍යස්ථානය (ආයුර්වේද මධ්‍යස්ථාන 05)
- පුස්තකාල හා ජංගම පුස්තකාල සේවාව (පුස්තකාල -10, ජංගම පුස්තකාල 01)
- විථි පහන් සේවාව (විථි පහන් 17550 පමණ)
- මාර්ග හා කාණු පද්ධති අළුත්වැඩියාව (මාර්ග 3902)
- මාතෘ හා ළදරු සායන පවත්වාගෙන යාම සඳහා දායක වීම.
- ගලි බවුසර් සේවාව (ගලි බවුසර් 02)
- පානීය ජල බවුසර් සේවාව (ජල බවුසර් 06)
- ක්‍රීඩා භූමි පහසුකම් ලබා දීම (ක්‍රීඩාංගන 31)
- වෙළඳ පොළ පහසුකම් හා සතිපොළ පහසුකම් ලබා දීම (සතිපොල 05 යි/ වෙළඳ පොල 14)
- ආදාහනාගාර සේවාව (ආදාහනාගාර 02)
- සුසාන භූමි නඩත්තුව (සුසාන භූමි 35)
- වසංගත රෝග පාලනය කිරීම සඳහා දායක වීම (ඩෙංගු, ජල භීතිකා)
- නගර ශාලා හා ප්‍රජා ශාලා පහසුකම් සැපයීම (නගර ශාලා 02, ප්‍රජා ශාලා 32)
- වෙන්නප්පුව ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගනය මගින් ලබා දෙන පහසුකම්,
  - i. පිහිනුම් තටාක පහසුකම්
  - ii. ගෘහස්ථ ක්‍රීඩා පහසුකම්
  - iii. එළිමහන් ක්‍රීඩා පහසුකම්
  - iv. කායවර්ධන මධ්‍යස්ථාන පහසුකම්

**අපගේ සේවාවන් පිළිබඳව ඔබගේ අදහස්, යෝජනා සහ පැමිණිලි පහත සඳහන් මාධ්‍ය මගින් ඉදිරිපත් කළ හැකිය.**

**WhatsApp – 0701832645**
**Email – wen@pswennappuwa.lk**
**Web – www.pswennappuwa.lk හෝ wennappuwapa pradeshiya sabha**

## ❖ සම්බන්ධ විය හැකි දුරකථන අංක

**සතියේ දිනවල පෙ.ව 8.30 ප.ව 4.15 දක්වා**

| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | - | 031-2255276 | කම්මල්පත්තුව උපකාර්යාලය | - | 031-2255275 |
| දන්කොටුව උපකාර්යාලය | - | 031-2258175 | කිරිමැටියාන උපකාර්යාලය | - | 031-2256544 |
| ෆැක්ස් | - | 031-2253249 | | | |
| ගරු සභාපතිතුමා | - | 077-7717870 | ලේකම් මහතා | - | 070 -2749873 |